# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1983 අංක 26 දරන මුද්‍රණාල (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 අගෝස්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල: ශත 20 යි　　　තැපැල් ගාස්තුව: ශත 50 යි

## 1983 අංක 26 දරන මුද්‍රණාල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1983 අගෝස්තු මස 10 වන දින]

එල්. ඩී.—ඕ. 119/78

**මුද්‍රණාල ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 26 දරන මුද්‍රණාල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මුද්‍රණාල ආඥාපනතේ 3 වන වගන්තියේ (1) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 178 වන අධිකාරයේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

“(1) 2 වන වගන්තියෙන් නියමිත එවැනි ප්‍රකාශනයක් නොකොට ඉහත කී පරිදි එවැනි යම් මුද්‍රණාලයක් සන්තකයේ තබා ගන්නා කවරකු වුව ද වරදකට වරදකරු විය යුතු අතර, ඒ සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට රුපියල් එක්දහසක් නොඉක්මවන දඩයකට හෝ මාස හයක් නොඉක්මවන කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඬුවම් දෙකට ම ඔහු යටත් විය යුතු ය. එවැනි යම් මුද්‍රණාලයක් ඇති යම් ස්ථානයක පදිංචිකරු, පටහැනි තත්ත්වය ඔප්පුකරනහොත් මිස, මේ වගන්තියේ කාර්යයන් සඳහා එම මුද්‍රණාලය ඔහු සන්තකයේ තබාගත් ලෙස සලකනු ලැබිය යුතු ය.”

ජ 70843—9,550 (83/06)

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළැඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.